**<u>30 වන උපාධි ප්‍රදානෝත්සවය - 2023</u>**
**<u>උපාධි ලෝගු, මාල හා උපාධි හිස්වැසුම් ලබා ගැනීම සහ ආපසු භාරදීම පිළිබඳ උපදෙස්:</u>**

1. 30 වන උපාධි ප්‍රදානෝත්සවය සඳහා උපාධිලාභීන් වෙත උපාධි ලෝගු, මාල හා හිස් වැසුම් 2023 දෙසැම්බර් මස 07, 08 හා 09 දිනයන් හි දී පෙ.ව. 9.00 - ප.ව. 3.00 දක්වා රුහුණ විශ්වවිද්‍යාලයීය වැල්ලමඩම සංකීර්ණයේ දී, ඔබගේ පීඨයට/උපාධියට අදාළව අමුණා ඇති කාලසටහන (Annex 01) අනුව සිදුකෙරේ. ඔබ පැමිණිය යුත්තේ ඔබට වෙන්කර ඇති කාලවේලාව තුළ දී පමණි.

2. උපාධි ලෝගු, මාල හා හිස් වැසුම් ලබාගැනිම සඳහා ඊට අදාළ අයදුම්පත ද ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කර ඇති ශිෂ්‍ය වාර්තා පොත හෝ ශිෂ්‍ය හැඳුනුම්පත උපාධි ලෝගු නිකුත් කරන නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. උපාධි ලෝගු, මාල සහ හිස් වැසුම් ලබා ගැනීමට පැමිණීමට පෙර ඔබ විසින් උපාධි ප්‍රදානෝත්සවය සඳහා ලියාපදිංචි වූ වෙබ් අඩවියෙහි (www.paravi.ruh.ac.lk/convocation) ඇතුළත් කර ඇති ප්‍රශ්නාවලිය සම්පූර්ණ කළ යුතු ය. එය සම්පූර්ණ කිරීමෙන් පසු ඔබට එම වෙබ් අඩවිය හරහා ලෝගු, මාල සහ හිස්වැසුම් ලබා ගැනීම/භාර දීම සඳහා වන අයදුම්පත බාගත (download) කළ හැකි අතර, එහි මුද්‍රිත පිටපතක් අදාළ දින රැගෙන පැමිණිය යුතු ය.

   සැලකිය යුතුයි: ප්‍රශ්නාවලිය හා අදාළ ගෙවීම් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් ලෝගු, මාල සහ හිස්වැසුම් ලබා ගැනීම/භාර දීමට අදාළ අයදුම්පත බාගත (download) කළ හැකි ය.

4. හැඳුනුම්පතක් නොමැති අයෙකු වෙතොත් ස්වකීය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා විශ්වවිද්‍යාලයට පිළිගත හැකි වෙනත් අනන්‍යතා සහතිකයක් රැගෙන පැමිණිය යුතු ය.

5. උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වෙන දිනයේ දී **<u>හෝ</u>** උපාධි ප්‍රදානෝත්සවය නිම වී සති දෙකක් ඇතුළත උපාධි ලෝගුව, මාලය සහ හිස්වැසුම මේ සමඟ ඇති අයදුම්පත මඟින් භාරගන්නා නිලධාරි/ගබඩා භාරකරු වෙත භාර දී අදාළ රිසිට්පත ලබාගත යුතු අතර, එසේ භාරදුන් බවට ශිෂ්‍ය වාර්තා පොතෙහි ද සහතික කර ගත යුතු ය.

6. නියමිත කාල සීමාව ඉකුත් වීමෙන් අනතුරුව උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස්වැසුම භාරදීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහා ම දිනකට රු. 250/= බැගින් වන ප්‍රමාද ගාස්තුවක් අයකරනු ලබයි.

7. ඔබ වෙත නිකුත් කරන ලද උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස්වැසුම ඔබ භාරයේ තිබිය දී යම් අලාභයක් හෝ හානියක් සිදු වී ඇත්නම් ඒවායේ සම්පූර්ණ වටිනාකම හා ඊට අතිරේක ව එම වටිනාකමින් 25% ක ගාස්තුවක් ගෙවිය යුතු වේ.

8. උපාධි ලෝගුව, මාලය සහ උපාධි හිස්වැසුම භාරදුන් බවට ලබාගත් රිසිට්පත උපාධි සහතික නිකුත් කරනු ලබන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඔබ හට උපාධි ප්‍රදානෝත්සව දිනයේ දී ම උපාධි සහතිකය ලබා ගත හැකි ය. ඒ සඳහා අදාළ වේලාව ඔබගේ පීඨයට අනුව අමුණා ඇති ලේඛනයේ පරිදි (Annex 02) සිදු කෙරේ. ඔබ පැමිණිය යුත්තේ වෙන් කර ඇති කාල වේලාව තුළ පමණි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/විභාග
රුහුණ විශ්වවිද්‍යාලය,
මාතර.
2023.12.01

**30th Convocation**
**Instructions for issuing and returning of cloaks, garlands and graduation hats**

1. Graduation cloaks, garlands and graduation hats for the convocation will be issued to the graduands at the Wellamadama complex of the University of Ruhuna, Matara on 07th, 08th and 9th December 2023 from 9.00 a.m. - 3.00 p.m. The time table for issuing cloaks, garlands and graduation hat is attached herewith. You will come your allocated time.

2. In order to obtain a cloak, a garland and a hat you should submit the application form attached with your university Student Record Book or Student Identity Card to the issuing officer of the cloaks.

3. Before coming to collect the graduation cloak, garlands, and graduation hat you must be completed the questionnaire included in the convocation registration website (www.paravi.ruh.ac.lk/convocation). After completing it, you can get application form related to collecting/handover of cloak, garland, and hat through the website, which should be downloaded, printed, and brought on the respective dates.

   Note: After completing the questionnaire and payment, the application form for collecting/handover of cloak, garland and hat can be downloaded.

4. A Student who fails to provide the university identity card, should submit any other form of identity which is acceptable to the university.

5. You should return the cloak, garland and graduation hat with the application form, which is already downloaded in the web site, to the Cloak Issuing Officer on the day of convocation **or** within a period of two weeks to the returning officer/storekeeper and obtain a receipt for returning it, and get it recorded in your Student Record Book.

6. A late fee of Rs. 250/= per day has to be paid after the assigned period for returning the cloak/garland.

7. If the cloak and the garland issued to you get damaged while in your care, you are supposed to pay to the university an amount to the value of its full replacement cost plus an additional amount of 25% of the same.

8. After you return your cloak and the garland and obtain a receipt for returning it and submit to the Certificate Issuing Officer and can collect your degree certificate on the day of convocation. The relevant time for that will be done according to your faculty as per the attached timetable (Annex 02). You should come only during the allotted time.

Senior Assistatn Registrar/Examinations
University of Ruhuna
Matara.

01.12.2023